# ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
# ශ්‍රී ලංකාව

## ශ්‍රී ලංකාව තුල ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය , අපනයනය, මිශ්‍ර කිරීම , නිෂ්පාදනය , සැපයීම , බෙදාහැරීම හෝ අලෙවිකිරීම

## සඳහා සුදුසුකම් ලැබීමට ඉල්ලීම් ඉදිරිපත්කිරීම සඳහා කරනු ලබන ආරාධනය

වෙළඳපොළට ඇතුළුවීම සඳහා ඇතැම් අවශ්‍යතා සහිතව ශ්‍රී ලංකාවෙහි ලිහිසි තෙල් වෙළඳපොළ විවෘත කර ඇත. වර්තමානයේ දී සන්නම් 22ක් යටතේ පාර්ශ්වකරුවන් 13 දෙනෙකු ශ්‍රී ලංකාවෙහි ලිහිසි තෙල් වෙළඳපොළ තුළ සිය මෙහෙයුම් ක්‍රියාත්මක කරයි. 2017 වර්ෂයේදී වාර්ෂික ලිහිසි තෙල් ඉල්ලුම කිලෝ ලීටර් 64,485 ක් වූ අතර එහි වටිනාකම රුපියල් බිලියන 26.5 කි.

ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ලිහිසි තෙල් සපයනු ලබන වෙළඳපොළක් සඳහා යෝග්‍ය තරගකාරිත්වයක් ඇති කිරීමේ අරමුණින් පහත සඳහන් අයිතම වෙළඳපොළට සැපයීමට සුදුසුකම් ලැබීම සඳහා ඉල්ලුම් කිරිමට ශ්‍රී ලංකා රජය අදාල පාර්ශවයන්ගෙන් ආරාධනා කර සිටී.

- **ලිහිසි තෙල් සහ ග්‍රීස්**
  - ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, මිශ්‍ර කිරීම, නිෂ්පාදනය, සැපයුම, බෙදාහැරීම හෝ අලෙවිය.
    හෝ
  - ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, සැපයුම, බෙදාහැරීම හෝ අලෙවිය.

- **නියම උපකරණ නිෂ්පාදකයා විසින් නිර්දේශ කරනු ලැබූ නියමිත සම්ප්‍රේෂණ තෙල් (CVT, ATF, Gear Oil)**
  - නියමිත සම්ප්‍රේෂණ තෙල් (අඛණ්ඩ විචලා සම්ප්‍රේෂණ තෙල් , ස්වයංක්‍රීය සම්ප්‍රේෂණ ද්‍රාවක හෝ ගියර්තෙල්) ආනයනය,අපනයනය,සැපයීම,බෙදාහැරීමහෝඅලෙවිය.

- **නාවික ලිහිසි තෙල් සහ ග්‍රීස්**
  - ශ්‍රී ලංකාව තුළ නාවික ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, සැපයුම, බෙදාහැරීම හෝ අලෙවිය.

සුදුසුකම් ලැබීම සඳහා වන ඉල්ලීම් ලියවිල්ලෙහි දක්වා ඇති ආකෘතියට අනුව සකස්කර 2018.11.05 දින 1500 පැයට පෙර ඉදිරිපත් කළ යුතු වේ.
සුදුසුකම් ලැබීම සඳහා වන ඉල්ලීම් ලියවිල්ල ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් හෝ www.petroleummin.gov.lk යන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.
මේ සම්බන්ධයෙන් වන පැහැදිලිකිරීම් සඳහා පූර්ව සුදුසුකම් රැස්වීමක් 2018.10.04 දින මෙම අමාත්‍යාංශයෙහිදී පැවත්වේ.

සභාපති
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුව
ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
අංක 80
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 7
2018 සැප්තැම්බර් 05